# පුස්කොළ ලේඛන නිර්මාණය කිරීම

කේ.ඒ.එන්. දමයන්ති[27]

ලංකාව මෙන්ම ඉන්දියාව ඇතුළු බොහෝ රටවල ප්‍රධාන මෙන් ම සුලබ ලේඛන ක්‍රමයක් ලෙස පුස්කොළ ලේඛන හඳුන්වාදිය හැකිය. පුස්කොළ ලේඛන කලාවට දීර්ඝ ඉතිහාසයක් පවතී. නිර්මාණය කිරීම සරළ ලෙස පෙනුනද ඉතා දුෂ්කර අදියර කීපයකින් සමන්විත ක්‍රියාදාමයකි. පුස්කොළ නිර්මාණය සඳහා ප්‍රධාන වශයෙන් ශාක පත්‍ර වර්ග තුනක් භාවිත කරයි එනම් **තල, තල්** සහ **ලොන්ටා** ශාක පත්‍රය. මේ අතරින් තල ශාක පත්‍ර බහුල ව භාවිත කරයි. තල ගොබය කපාගැනීමේ සිට තල කොළය මත අකුරු සටහන් කිරීම දක්වා ක්‍රියාවලිය ඉතා සංකීර්ණය. මෙම ක්‍රියාවලිය තල් කොළ භාවිත කර ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මඟින් බලාපොරොත්තු වේ.තල ගොබය කපාගැනීමෙන් අනතුරුව එකිනෙක කොළ වෙන්කර පිහිකටුවෙන් හෝ දුණු පිහියෙන් ඉරටු ඉවත් කරනු ලැබේ. කොළ අග කුඩා සිදුරක් කපා වියළීමේ දී ප්‍රයෝජනයට ගනී. ඉරටු ඉවත් කළ තල් කොළ අකුලාගැනීමක් සිදු කරයි. කොළයක් ගෙන මුල සිට අගට රෝල් කර කෙළවර අවසන් වීමට වියතක් තිබියදී තව කොළයක මුල පැත්ත තබා ඔතයි. මෙලෙස වට්ටුවෙ විශ්කම්භය අඩියක් පමණ වන තුරු ඔතා තල් කොළ වලින් ලිහිල්ව බඳී. සකස් කළ තල් කොළ වට්ටු භාජනයකට දමා ඖෂධ එකතු කර තැම්බීම සිදු කරයි. පැපොල් කොළ හා ගැට, අන්නාසි කොළ, බිලිං කොළ, කැප්පෙටිය කොළ, පින්න කොළ, බෝමු කොළ සම ව සැලියේ ස්තරයක් අතුරා එ මත තල් කොළ දැවටුම් ස්තරයක් අසුරනු ලැබේ. ස්තර අනුව සැලිය පිරෙන්නට ආසන්න වූ විට කැප්පෙටි කොළ දමා කෝටු කැබලි තබා සිර කරයි. හැලියේ මුවවිට කඩ රෙද්දක් බැද පැය 2- 3 තැම්බෙන්නට හරී. කඩතොළු කළ විට පිටි ගතියක් මතුවේ නම් පදමට තැම්බී ඇත. තම්බාගත් වට්ටු පිරිසිදු ජලයේ සෝදා රැහැනක් මත එල්ලා වැටෙන සේ දමා හොඳින් හිරු පායන දින තුනක් මද පවනේ වියලා, සරා සඳ පායා ඇති දින තුනක් සඳ එළියේ වියළා ගනු ලැබේ. ඇද පළුදු කොළ සම තත්ත්වයට ගෙන ඒමට ඔප දැමීම සිදු කර සම්මත රීතිවලට අනුව අවශ්‍ය ප්‍රමාණයට කපා ගනී. අනතුරුව පිළිවෙලින් පුස්කොළ වල සිදුරු විදීම, රත ගෑම, කළු මැදීම, සුදමැදීම, කම්බාව සකිය එකතු කර ලණුවෙන් පුස්කොළ පොත බැදීම සිදු කරයි.අතීතයේ පඬිවරු විසින් තම ශිල්ප ශාස්ත්‍ර රැකගැනීම උදෙසා පුස්කොළ පොත් සකසන්නට විශාල පරිශ්‍රමයක් දරා ඇති බව මේ අනුව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃවට්ටු, කම්බාව, සකිය

[27]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.